අප භාවිතා කරන භාෂාව තුළ අතීතයේ භාවිතා වූ යම් යම් යෙදුම්, වර්තමාන සන්දර්භයන් තුළ කෙතරම් යෝග්‍ය වන්නේද යන පැනය ඇතැම් විට පැන නගී. එයට එක් උදාහරණයක් ලෙසින් 'හාම්පුතා' යන යෙදුම දැක්විය හැක. මෙම යෙදුම වර්තමානයට ගැලපෙන්නේද යන්න ප්‍රශ්නකාරී වන්නේ, හාම්පුතා යන යෙදුම මගින් අතීතයේ නියෝජනය වූ සමාජ සම්බන්ධතාවය වර්තමානයෙදී වඩාත් වෘත්තිමය සම්බන්ධතාවයක් දක්වා වෙනස් වී තිබීම නිසායි. වර්තමානයේදී දක්නට ලැබෙනා සේවානියුක්ත-සේවායෝජක සම්බන්ධතාවය හා සසඳා බලන විට, හාම්පුතා යන යෙදුම වඩාත් පසුගාමී ස්වාමි-සේවක සම්බන්ධතාවයක් පිළිබඳ අදහසක් ජනිත කරයි.

මෙම පුවත් වාර්තාව තුළ දැක්වෙන ත්‍රෛපාර්ශ්වික ගිවිසුම අත්සන් කෙරෙනා 'හාම්පුතුන්' ලෙසින් දැක්විය හැකි වෘත්තිය පාර්ශවයක් වර්තමානය තුළ තිබේද? එසේ නැතිනම් එයට වඩාත් යෝග්‍ය වන්නේ සේව්‍යයන් හෝ සේවායෝජකයන් වැනි යෙදුමක් නොවේද? අතීතයේ 'ලංකා හාම්පුතුන්ගේ සම්මේලනය' ලෙසින් වූ නාමය පවා වර්තමානයේදී 'ලංකා සේව්‍ය සම්මේලනය' බවට වෙනස්ව ඇති බවද මෙහිදී පෙන්වා දිය යුතු වේ.

එසේම මෙම පුවත් වාර්තාව ඇමති නිමල් සිරිපාල ද සිල්වා විසින් කළ ප්‍රකාශයක් පදනම් කරගනිමින් ඉදිරිපත් වූවත්, ඇමතිවරයා සිය ප්‍රකාශයේ 'හාම්පුතුන්' යන යෙදුම භාවිතා කොට තිබුණත්, ඒ සඳහා වඩාත් කාලෝචිත යෙදුමක් යොදාගැනීමේ වගකීම එය වාර්තාකරනා මාධ්‍ය අත ඇති බවද අවසන් වශයෙන් සිහිපත් කරමු.
**#MediaEthicsSL #lka #SinhalaPress #Dinamina**